# සිතුවිලි මුතු අකුරු විය



සිතුලි කුලංගනා පාඬිගම

# සිතුවිලි මුතු අකුරු විය

## සිතුලි කුලංගනා පාඬිගම

කතෘ

මහාමායා බාලිකා විදුහල
මහනුවර

## කතෘගේ වෙනත් කෘති

ළමා කතාන්දර :-

| | |
|---|---|
| හොඳ යාළුවෝ | - 2019 |
| හොද පාඩමක් | - 2021 |
| හොල්මනක් දුටුවෙමි | - 2023 |

ළමා කවි :-

| | |
|---|---|
| මගේ කවි පොත | - 2021 |

## පිටකවරය

සිතුලි කුලංගනා පාඬිගම

## කෘතිය පළ කරන දිනය

2025 පෙබරවාරි 08
**ISBN - 978-624 208 -713-9**

**පිදුම**

මල්ලියි මමයි වෙනුවෙන්

ලොවක් තනන්නට

සයුරෙන් එහා ගොස්

සිත ගලක් කරගෙන සිතින් අඬන

මගේ අප්පච්චිට

මේ පොත පිළිගන්වමි.

**ස්තූතිය**

හැමදාම ළඟ ඉන්න

මගේ අම්මාටයි, මල්ලිටයි

## අප්පච්චි

සිහිනයෙන් ඇවිදින්

මගේ මුව සිඹිමින්

ආදරයෙන් සනසමින්

හිනැහී ළඟ හිඳිමින්

නුඹයි අප්පච්චි

ළඟ උන්නේ

නොවිදිනා දුක් විඳ - හෙලා දහඩිය කඳුළු

රජකරවන්න අප සැවොම

තනියම නුඹ අඩනවද

ජීවිතේ දුකක් බව - බුදු සාදු කිව්වානේ

ඉතිං අපි එක්ව දුක් වෙමු

සතුට ළඟ හිනැහෙමු

ඉතින් ඒ නිසා

ඉක්මනින් එන්න

මගේ අප්පච්චි

**මගේ අත්තම්මලා**

අම්මා එනතුරු ළං කර

ආදරයෙන් තුරුළු කර

හැම විටම සොයා බලන

මගේ අත්ම්මලා,

මට මවකි හැමවිටම

අතින් බිම නොතියා

මා වට කර සිනා බිඳිනා

සිතූ පැතූ දේ ගෙන දෙනා

මගේ අත්තම්මලා මා ළග සිටිනා

ගුණ නුවණ වත් පොහොසත් කමයි කියනා

රජ යන්නේ ලොවේ එයයි කියනා

හැම විටම මගේ රුව තුටින් ගයනා

හැමදාම නුඹලාට පින් මගේ ලගම ඉන්නවාට

## සඳ කුමරි සමග

හිරු එළිය නැති වුණා

අඳුර ලොව රජ වුණා

රැහැයි හඬ දස අතේ පැතිරුණා

සිත බියෙන් සැලුනා

සඳ කුමරි ටිකෙන් ටික මගේ සිතට ළං වුණා

සඳ එළියේ ඇවිදින්න

මගේ සිත  කියවනා

පුන් සඳ දා ලොව එළි කර

නැතිදා අඳුරු කර

මෙහෙම කුමටද

සීතලයි ඇඟ වටා එතෙනා

නිසංසල බව ලොවට කියනා

සීත මීදුමෙන් බිහිවුණ සඳ රැජිණ

දැකුම් කළුයි මගේ අම්මා මෙනා

ඒ සඳ බබලමින් මම ජීවිතය පුරා

ඒ සඳ කුමරි නැතිදා මගේ

මුළු  ලොවම පාළු වෙනා

# අම්මා

අහස අතහැර නොයන

තරුවකි නුඹ මට

හැමදාම ළග ඉන්න

හොඳම මිතුරිය නුඹ

දුක සැප ද මා හා

එක්ව විද සැනසෙනා

අඩන්නට දුක කියන්නට

මගේ මිතුරිය නුඹයි සැමදා

හිරු රැසින් මා රැකෙනා

සියුමැලි මා සිතට

වදනින් සැනසෙන්නට කියන්න කවි කතන්දර

නුඹයි මා මිතුරිය මවක් වී මගේ ලොවට ආ .........

**සිදුහත් බෝසතාණන්ගේ උපත**

**හරි පින්වත්ය**

මල් යාහනක ඉපදුන

මහා මායා දේවිය තම මව කරවූ

සුද්ධෝදන රජුගේ

එකම පුතා වූ

ලොවට අග වූ සිදුහත් උපතයි මේ

බෝසත් මව් උකුලට වීලා

දෙවියන් වැදුම් පිදුම් දීලා

දසත පුරා සුවඳ කරලා

සත් නෙලුම් මලින් ගොස් ලොවට පෙන්නා

උදා ලහිරුසේ ලොව සනසන්නට

තරු වියනක් වී එළිය දෙන්නට

උපන්නේ නුඹයි

මගේ බුදු පුත් කුමරු

## අලුත් දවසක්

අලුත් දවසට ඉර පායා එයි

කුරුළු හඬින් දසත පැතිරේ

නැවුම් සුවඳින් ලොව එළියකර

සිත පිබිදෙයි හරි සතුටින්

පළමුව අම්මා අවදි වෙලා

ගේ දොර වැඩ වල නිරත වෙලා

ඈ එහෙ මෙහෙ දුවමින් දගලන්නේ

දරුවන් පාසැල් ගෙන යන්නේ

බුදු රුවනට පළමුව වැඳ

දෙවනුව මව් පිය පුදා

මේ යන්නේ පාසලටයි

අලුත් දවසක් ඇරඹුමට

# රැල්ල අරුමය

රට වට කරන්න

අපව රැක ගන්න ඔබ

විටක හරි ලස්සනයි

නමුත් හිතන විට බයයි

ඔබ දකිනා අය

ඈත දුර සිට නෙත් අයා

දෙස් විදෙස් අය ඇවිත්

සතුටු වෙයි හිනැහිලා

රැල්ල ඇවිදින් ළගට

වෙරළ සිප ගන්න සැටි

නටයි  වැල්ලේ

දකින අප සිත් පිනා

ජීවිත රැසක්

එකවරම බිලිගන්න සිතුනේ කොහොමද නුඹට

ලොව ඉන්න දරුණු වූ

අහිංසකයා ඔබයි මුහුදේ හිමි කරු

## පවුලට ආදරේ

පුංචි කළ සිටම දරු සෙනෙහෙ රදවා
ලේ කිරි වූ කල ලෙවූ කවි මට දීලා
රජ කල මා සෙනෙහේ තබා නැමුවා
ආදරයේ ආරම්භය ඔබයි අම්මා

නිතරම මා සිඹලා
කවි ගී කියා නළවලා
අතට ගෙන මා තුටින් පහන් කළ
අප්පච්චි ඔබයි මට ලොව පුරා

" අක්කා" කියා පළමුව අඬගසා
සෙල්ලමින් මා රවටලා
විහිළු තහළු කතා මට කියා
දුකට සැපට සිටි එකම කෙනා
මගේ මල්ලි රජ වෙනා

# ගුරුමව්නි

හෙට ලොව ජයගන්නට

වෙර දරණ දරු කැලට

මවක් වූ ගුරු මවුනි

සදා ඔබට ණයගැති මා

නැණ මල් පුපුදාලා

හැඩ දමා රස කර

තුටින් හිතැඟි නුඹේ මුව

කියූ වදන් නිමක් නැත

සිප් බසින් පුරවනා

ගුණ කඳින් දිදුලනා

සෙත් කවින් පද ගලපලා

කියන්නට දරු කැලට පෙමිනා

ඔබේ සෙවන මට

ශක්තියකි, ධෛර්යකි

ගුරු මව්නි නිබඳ නුඹ

පින් කඳකි මට නුඹ මට .......

## වලාකුළ

වේලාවක අඳුරු වී

හඬා වැටෙනා නුඹ

මා වගේම දෝ

මටම සිතුණා

නැවත හිනැහි

සිත සලනා

වළාකුළු මා වම දැයි

නැවත මට සිතුණා

හරිම ලස්සන චිත්‍රයක්

කවියකට හැඩයක්

හිතට හරි සිසිලක්

ලොවකටම තැණුන වියනක්

අහසටම වී ඉන්න

උඩු වියන නුඹම දෝ

සුන්දරව පාවෙනා

දසුනින් ඉක්මනින් ඈත් නොවෙනා

නුඹවමයි මා

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම්පෑම එයට හේතුවයි. පාසල තළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මාහට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් දිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකකට සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කාථික රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන්ය ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්